සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පළමු වාර පරීක්ෂණය 2015

# ව්‍යවසායකත්ව අධ්‍යයනය - I

11 ශ්‍රේණිය  කාලය පැය 01 යි.

| නම/ විභාග අංකය: |
|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 40 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ව්‍යවසායකයා යන්නට විවිධ පුද්ගලයින් හා ආයතන විවිධ නිර්වචන ලබාදී ඇත. ඒ අනුව ''අර්ථ ක්‍රමය තුළ පවත්නා අවස්ථා සොයමින් ඒ පසුපස යන්නා'' ලෙස අර්ථ කථනය කරන ලද්දේ,

(1) රිචඩ් කැන්ඩිලන්ය. (2) අන්තර්ජාතික කම්කරු සංවිධානයි.
(3) ජීන් බැප්ටිස්සේය. (4) කර්ස්නර්ය.

02 ව්‍යවසායකයා පරිසර විශ්ලේෂණයටත්, එහි අවස්ථා හඳුනාගැනීමටත්, සම්පත් යෙදවීම හා අදහස් ක්‍රියාත්මක කිරීමටත් ඇති හැකියාව නිසා ඔවුහු

(1) කොටස්කරුවන් වෙති. (2) අධ්‍යක්ෂවරු වෙති.
(3) ප්‍රවර්ධකයින් වෙති. (4) හවුල්කරුවන් වෙති.

03 ව්‍යාපාරිකයින්ගේ සමාජ වගකීමක් වනුයේ,

(1) පරිසරය සුරැකීම
(2) නිවැරදි කිරුම් මිනුම් උපකරණ භාවිතය
(3) ආයෝජනයට ප්‍රමාණවත් ඉපයීමක් ලබාදීම
(4) සේවකයිනට සාධාරණ වැටුප් ගෙවීම

04 ව්‍යාපාර යන්න පැහැදිලි කිරීම සඳහා වඩාත් සුදුසු ප්‍රකාශය වනුයේ,

(1) ආයෝජකයින්ගේ ආර්ථික ක්‍රියාවලියකි.
(2) ආර්ථික සම්පත් ක්‍රියාත්මක වන අවස්ථාවකි.
(3) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා කෙරෙන ඕනෑම කටයුත්තකි.
(4) ලාභය පෙරදැරි කර මුදල් යොදවා කරන ආර්ථික කටයුත්තකි.

05 ව්‍යවසායකත්ව ගුණාංගයක් ලෙස සැලකිය නොහැක්කේ කුමන කරුණක් ද?

(1) නිර්මාණශීලී වීම (2) කැපවීම
(3) නම්‍යශීලී වීම (4) ඕනෑම අවදානමක් දැරීම

06 වෘත්තීය ව්‍යාපාර සඳහා වැඩි වශයෙන් යොදාගන්නා සංවිධාන ක්‍රමය වනුයේ,

(1) තනි පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර
(3) සීමිත පෞද්ගලික සමාගම් (4) ජනතා සමාගම්

07 ව්‍යවසායකත්වය යනුවෙන් අදහස් වන්නේ,

(1) ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමයි. (2) අවදානම් දැරීමයි.
(3) නව්‍යතා මගින් වෙනස්කම් ඇතිකිරීමයි. (4) ව්‍යාපාර කළමනාකරණයයි.

08 සංවර්ධනය වන ආර්ථිකයක ව්‍යවසායකත්වය මගින් ඉටුවන්නේ විශාල මෙහෙවරකි. ඒ අනුව ව්‍යවසායකත්වය තුළින් ජාතික වශයෙන් ලබාදෙන ප්‍රතිලාභයකි.

(1) නාගරීකරණය අවම වීම. (2) හොඳ වෙළඳපොළක් බිහිවීම.
(3) සංවර්ධනය නොවූ ප්‍රදේශ සංවර්ධනය වීම. (4) නව්‍යතා බිහිවීම.

09 ව්‍යවසායකයෙකු ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයකින් මූලිකව සේවකයා හා සේව්‍යයා යන පාර්ශවයන් දෙක ප්‍රතිලාභ භුක්තිවිඳියි. ප්‍රතිලාභ භුක්තිවිඳින තෙවැනි සහ සිව්වැනි පාර්ශව වනුයේ,

(1) පාරිභෝගිකයා සහ නිෂ්පාදකයායි. (2) පාරිභෝගිකයා සහ වෙළෙන්දායි.
(3) පාරිභෝගිකයා සහ සමාජයයි. (4) පාරිභෝගිකයා සහ පවුලේ අයයි.

10 ව්‍යවසායකත්ව සංවර්ධනයට බලපාන විවිධ අභියෝග පවතී. එසේ බලපානු ලබන අභියෝගයක් නොවන්නේ,

(1) මනෝවිභීතිය (2) සංස්කෘතිය (3) පවුල (4) උපායශීලී බව

11 ව්‍යාපාරයක් කරගෙන යෑමේ දී අයිතිකරුගේ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යයි නම් ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ. මෙම තත්ත්වය

(1) ව්‍යාපාර සංස්කෘතියෙන් වන බාධාවකි. (2) නෛතික පරිසරයෙන් වන බාධාවකි.

(3) දේශපාලන පරිසරයෙන් වන බාධාවකි. (4) ආර්ථික පරිසරයෙන් වන බාධාවකි.

12 පුද්ගලයින්, සංවිධාන හා විවිධ පාර්ශවයන් විවිධ ආකාරයට සමාජ ව්‍යවසායකත්වයේ යෙදෙනු දක්නට ලැබේ. එසේ සමාජ ව්‍යවසායකත්වය මගින් සමාජයට සහ ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභයක් විය නොහැක්කේ,

(1) සමාජයීය පුද්ගල සුභසාධනය

(2) සමාජයීය පුද්ගල සුභසාධනය

(3) රජයට සුභසාධනය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම අවම වීම.

(4) මානව ප්‍රාග්ධනයේ ගුණාත්මක බව අඩුවීම.

13 කාන්තාවක් ව්‍යවසායකත්වයට යොමුවීම තුළින් විවිධාකාර දායකත්වයන් සැපයේ. එසේ දායකත්වය සැපයීමේ දී එම කාර්යයේ යෙදෙන ව්‍යවසායිකාවටම ලැබෙන ප්‍රතිලාභයක් විය හැක්කේ,

(1) ආත්ම අභිමානයක් ඇතිවීම.

(2) රැකියා නියුක්තියට පිළියමක් වීම.

(3) දේශීය සම්පත්වලින් ප්‍රයෝජන ගැනීම.

(4) ලාභවලින් යම් ප්‍රමාණයක් සමාජ සුභසාධනයට යෙදවීම.

14 ව්‍යාපාර බහුලවශයෙන් ක්‍රියාත්මක වනුයේ කුඩා ව්‍යාපාර වශයෙනි. මෙම කුඩා ව්‍යාපාර හඳුනාගන්නා ගුණාත්මක නිර්ණායකයක් වනුයේ,

(1) ආයෝජිත ප්‍රාග්ධනය (2) භාවිතා කරන තාක්ෂණය

(3) නිෂ්පාදන ධාරිතාව (4) වාර්ෂික පිරිවැටුම

15 කුඩා ව්‍යාපාර සම්බන්ධයෙන් පැවතියහැකි දුර්වලතාවක් විය නොහැක්කේ,

(1) මූල්‍ය දුෂ්කරතා

(2) දියුණු මට්ටමේ සැලසුම්කරණයක් නොවීම

(3) නව තාක්ෂණය භාවිතයට ගැනීමේ දුෂ්කරතා

(4) මහා පරිමාණ ව්‍යාපාර සමග තරග කිරීම

16 ව්‍යවසායකයිනට මිනිස් වුවමනා ඉතාමත් වටිනා දෙයකි. මෙම මිනිස් වුවමනා සම්බන්ධයෙන් අදාළ නොවන පිළිතුර වනුයේ,

(1) අත්‍යවශ්‍ය නොවීම. (2) නිර්මාණය කළ හැකි වීම.

(3) අසීමිත වීම. (4) පොදු වීම.

17 ව්‍යවසායකයකු බිහිවීමට විවිධ සාධකයන් බලපානු ලබයි. එසේ බලපෑම් කරනු ලබන සමාජ ආර්ථික පසුබිම් සාධකයට අයත් වන්නකි

(1) රාජ්‍ය ප්‍රතිපත්ති

(2) ව්‍යාපාරවල යෙදෙන පිරිස් වැඩියෙන් ඇසුරු කිරීම

(3) මූල්‍ය සහාය

(4) වර්තමාන රැකියාව කෙරෙහි කලකිරීම

18 නිෂ්පාදනයක පිරිවැය පිළිබඳ සැලකිලිමත්වීම ඉතා වැදගත් වේ. ඒ අනුව පිරිවැය අඩුකර ගත හැකි ක්‍රමයක් නොවන්නේ,

(1) ප්‍රශස්ත සේවක මණ්ඩල කළමනාකරණය

(2) අමුද්‍රව්‍ය සහ නිමිද්‍රව්‍ය තොග පාලනය

(3) අනවශ්‍ය මිලදී ගැනීම

(4) අපද්‍රව්‍ය කළමනාකරණය

19 සිය දැනුම හා ශක්තීන් යොදාගෙන තමාගේම ව්‍යාපාරයක් මෙහෙයවීම ව්‍යවසායකයින්ගෙන් සිදුවේ. ව්‍යවසායකයා සම්බන්ධ වාසිදායක කරුණක් වනුයේ,

(1) කාලය සීමා සහිත බව (2) අමතර ප්‍රතිලාභ නැත

(3) වැඩි වගකීම (4) නිදහස් තීරණ ගත හැකිවීම

20 ව්‍යාපාරිකයකුට තම ව්‍යවසායකත්ව කාර්යයේ නියුතුවීමේ දී විවිධ භූමිකා යටතේ කටයුතු කිරීමට සිදුවේ. ඒ අනුව කටයුතු කිරීමේ දී කළමනාකාරීත්ව භූමිකාව යටතේ ඉටුකරන කාර්යයක් වනුයේ,

(1) සම්පත් සැපයීම (2) සම්පත් බෙදාහැරීම

(3) මෙහෙයවීම (4) සන්නිවේදනය

21 ව්‍යාපාරයක් කෙරෙහි බලපෑම් කරනු ලබන අභ්‍යන්තර පරිසර සාධක පමණක් අයත් වන පිළිතුර වන්නේ,

(1) අයිතිකරු, කළමනාකරු, ප්‍රජා පරිසරය

(2) අයිතිකරු, කළමනාකරු, ස්වභාවික පරිසරය

(3) අයිතිකරු, කළමනාකරු, සේවකයන්

(4) ප්‍රජා පරිසරය, ස්වභාවික පරිසරය, කළමනාකරුවන්

22 පාසලක කාලච්ඡේදයෙන් කාලච්ඡේදයට වෙනස්වීම දැනුම් දෙනුයේ පරිගණකය භාවිතා කර පරිගණක තාක්ෂණය යටතේය. මෙම සන්නිවේදනය අපට හැඳින්විය හැක්කේ,

(1) විද්‍යුත් වාචික සන්නිවේදන ක්‍රමයක් ලෙසය.

(2) විද්‍යුත් සංඥා / සලකුණු සන්නිවේදන ක්‍රමයක් ලෙසය.

(3) විද්‍යුත් නොවන වාචික සන්නිවේදන ක්‍රමයක් ලෙසය.

(4) විද්‍යුත් නොවන සංඥා / සලකුණු සන්නිවේදන ක්‍රමයක් ලෙසය.

23 ව්‍යාපාර සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන විසින් ව්‍යාපාර ආරම්භ කිරීම, පවත්වාගෙන යාම, ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දීම ආදිය ලබාදීම අයත්වන්නේ මූල්‍ය නොවන කුමන පහසුකම් යටතටද?

(1) තාක්ෂණික පහසුකම් ය. (2) උපදේශන පහසුකම් ය.

(3) අළෙවි පහසුකම් ය. (4) යටිතල පහසුකම් ය.

24 ව්‍යාපාර කටයුතු සඳහා යොදාගන්නා සම්පත් අතර වැදගත් සම්පතකි මානව සම්පත. මෙම සම්පත පිළිබඳ අධ්‍යයනයේ දී වැදගත් වන ප්‍රජා විද්‍යාත්මක සාධකයක් ලෙස ගතහැකි වන්නේ,

(1) ජනගහන වර්ධනය (2) සමාජ පන්තිය

(3) හැසිරීම් රටා (4) පරිභෝජන රටාව

25 බැංකු අයිරා පහසුකම් සම්බන්ධයෙන් අදාළ නොවන පිළිතුර වනුයේ,

(1) වාණිජ බැංකුවක ජංගම ගිණුමක් පැවතීම අවශ්‍ය වේ.

(2) කෙටි කාලීනව සුරැකුම් සහිතව හෝ රහිතව ලබාගත හැකිය.

(3) කෙටිකාලීන බැංකු ණය පහසුකමකි.

(4) ජංගම ගිණුමේ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා චෙක්පත් ලියවිය හැක.

26 ව්‍යාපාරයක් කෙරෙහි බලපෑම් ඇතිකරන ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් වන්නේ,

(1) විදේශ වෙළඳ ප්‍රතිපත්ති, පොලී අනුපාත, මිල මට්ටම්, විදේශ විනිමය අනුපාතික

(2) විදේශ විනිමය අනුපාතික, විදේශ වෙළඳ ප්‍රතිපත්ති, වැටුප් අනුපාත

(3) නිමැවුම්, වැටුප් අනුපාතික, පොලී අනුපාතික, පරිභෝජන

(4) නිමැවුම්, පරිභෝජන, විදේශ වෙළඳ ප්‍රතිපත්ති, වැටුප් අනුපාතික

27 ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම කිරීමෙන් පසු එකී කාර්යයේ සාර්ථක අසාර්ථක බව පිළිබඳ ඇගයීමක් කිරීම අවශ්‍ය වේ. එම ඇගයීම තුළින් අපේක්ෂා නොකරන කරුණක් වනුයේ,

(1) ශක්තීන් හා දුර්වලතා හඳුනාගැනීම.

(2) නිවැරදි තීරණ ගැනීම.

(3) සීමිත සම්පත් උපරිම ප්‍රයෝජනයට ගැනීම.

(4) අවදානම වැඩිකර ගැනීම.

28 පාරිභෝගිකයාගේ මිලට ගැනීමේ ක්‍රියාවලිය පිළිවෙලින් සඳහන් වන්නේ,

(1) වුවමනා හඳුනාගැනීම, තොරතුරු සෙවීම, තොරතුරු ඇගයීම, මිලට ගැනීමට තීරණය කිරීම.

(2) තොරතුරු සෙවීම, තොරතුරු ඇගයීම, වුවමනා හඳුනාගැනීම, මිලට ගැනීමට තීරණය කිරීම.

(3) මිලට ගැනීමට තීරණය කිරීම, තොරතුරු සෙවීම, තොරතුරු ඇගයීම, වුවමනා හඳුනාගැනීම.

(4) මිලට ගැනීමට තීරණය කිරීම, වුවමනා හඳුනාගැනීම, තොරතුරු සෙවීම, තොරතුරු ඇගයීම.

29 පාරිභෝගික හැසිරීම කෙරෙහි බලපාන සාධක අතර සංස්කෘතික සාධකයක් වනුයේ,
(1) සංජානනය (2) ජීවන රටාව (3) සමාජ පන්තිය (4) පවුල
30 නිෂ්පාදිතයක මිල කිරීමේ දී සලකා බලන බාහිර සාධකයක් වනුයේ,
(1) නිෂ්පාදිතයේ ස්වභාවය (2) වෙළඳපොළ ඉල්ලුම
(3) ආයතනයේ අරමුණු (4) අළෙවි අරමුණු
31 භාණ්ඩවල අයිතිය තමා වෙත තබාගනිමින් තොග වෙළඳාමෙහි නිරතවන තොග වෙළෙන්දා වනුයේ,
(1) වණික් තොග වෙළෙන්දා ය. (2) නියෝජිත තොග වෙළෙන්දා ය.
(3) තැරැව්කරු ය. (4) කැපකරු නියෝජිතයා ය.
32 ප්‍රධානියා වෙනුවෙන් තම පෞද්ගලික නමින්ම වෙළඳ ගනුදෙනුවලට සම්බන්ධ වෙමින් භාණ්ඩ තමා සන්තකයේම රඳවා ගනිමින් කටයුතු කරන නියෝජිතයා වනුයේ,
(1) කොමිස් නියෝජිතයා ය. (2) ප්‍රේරක නියෝජිතයා ය.
(3) කැපකරු නියෝජිතයා ය. (4) වණික් තොග වෙළන්දා ය.
33 පෞද්ගලික විකුණුම් ක්‍රමයේ ලක්ෂණයක් විය නොහැක්කේ,
(1) තොරතුරු වාචිකව හා ලිඛිතව ඉදිරිපත් කිරීම.
(2) සීමිත පුද්ගල සංඛ්‍යාවක් පමණක් සම්බන්ධ කර තිබීම.
(3) ගැනුම්කරුගේ අවශ්‍යතාත්, චර්යාවත් හඳුනාගනිමින් පොළඹවා ගැනීම.
(4) වාචික තොරතුරු සරලව මෙන්ම ගැඹුරින් ද ඉදිරිපත් කිරීමට හැකිවීම.
34 ව්‍යාපාර සංවිධාන අයිතිය අනුව වර්ග කිරීමේ දී පෞද්ගලික අංශයට අයත් නොවන ව්‍යාපාර සංවිධානය වනුයේ,
(1) කේවල ස්වාමි ව්‍යාපාරය (2) සීමා සහිත සමාගම්
(3) රාජ්‍ය අංශයේ සීමා සහිත සමාගම් (4) සමුපකාර
35 ව්‍යාපාර සංවිධාන පෞද්ගලික හා පොදු වශයෙන් වර්ගීකරණය කරනු ලබන පදනම වනුයේ,
(1) ව්‍යාපාරයේ අරමුණු අනුවය.
(2) ලාභාලාභ බෙදාගන්නා ක්‍රමය අනුවය.
(3) කළමනාකරණයට සහභාගි වන ආකාරය අනුවය.
(4) හිමිකාරත්වය (අයිතිය) අනුවය.
36 සාමාන්‍යයෙන් විශාල ප්‍රාග්ධනයක් එක්රැස් කරගත හැකි ව්‍යාපාර සංවිධාන ක්‍රමය වන්නේ කුමක් ද?
(1) හවුල් ව්‍යාපාරය (2) සීමිත පොදු සමාගම්ය
(3) තනි පුද්ගල ව්‍යාපාරය (4) සමුපකාර සමිතිය
37 ව්‍යාපාරිකයකුට පහසුවෙන් පාලනය කළහැකි පරිසරයකි.
(1) සමාජ හා සංස්කෘතික පරිසරය (2) ප්‍රජා පරිසරය
(3) අභ්‍යන්තර පරිසරය (4) තාක්ෂණික පරිසරය
38 හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ වගකීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) හවුල්කරුවන් සාමූහික වශයෙන් වගකීමට බැඳේ
(2) හවුල්කරුවන්ගේ වගකීම බාහිර කෙනෙකුට පැවරිය හැක.
(3) හවුල්කරුවන්ගේ වගකීම අනිකුත් හවුල්කරුවන්ට පැවරිය හැක.
(4) හවුල්කරුවන් සාමූහිකව වගකීමට බැඳී නැත.
39 ව්‍යාපාරයකට අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ අත්පත්කර ගැනීම සඳහා මුල්‍ය පහසුකම් සැපයීමට විශේෂීකරණය වූ ආයතනය වනුයේ,
(1) මුල්‍ය සමාගම්ය (2) කල්බදු සමාගම්ය
(3) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්ය (4) මුදල් තැරැව්කාර ආයතනයන්ය
40 අවම වශයෙන් සාමාජිකයින් දසදෙනෙකුගේ සහභාගීත්වයෙන් ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධානය වනුයේ,
(1) සීමාසහිත පෞද්ගලික සමාගම් (2) සීමිත පොදු සමාගම්
(3) සමුපකාර සංවිධාන (4) හවුල් ව්‍යාපාර

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පළමු වාර පරීක්ෂණය 2015

# ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

11 ශ්‍රේණිය කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01 පාසල් අධ්‍යාපනය අවසන් කළ ඉඳුනිල් විනෝදාංශයක් වශයෙන් පිඩැලි කපා ක්‍රමවත්ව තම ගෙවත්ත අලංකරණය කරනු ලැබූ සුන්දර තරුණයෙකි. එය දුටු නෑදෑ හිතමිතුරන් කිහිපදෙනෙකුද ඉඳුනිල් කැටිව ගියේ තම ගෙවත්ත ලස්සනකර පිළියෙල කර ගැනීමට ය. ඒ අතරවාරයේ ඉඳුනිල්ගේ නෙත ගැටුනේ ගෙවතු අලංකරණ පාඨමාලාවක් හැදෑරීම පිණිසය. එම පාඨමාලාව සාර්ථකව නිම කරනු ලැබූ ඔහු ''ඉඳුනිල් ගාර්ඩන්'' නම් ව්‍යාපාරික ස්ථානය ආරම්භ කිරීමට පෙළඹී ඇත. ඒ අනුව අද ඉඳුනිල් ගෙවතු අලංකරණය කරදීම පමණක් නොව ගෙවතු අලංකරණයට අවශ්‍ය ගඩොල්, කුළුණු, ලාම්පු කණු, පිළිම ආදී ද්‍රව්‍ය තොග වශයෙන් ද සපයන ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයෙකු බවට පත්වූ පුද්ගලයෙකි.

(1) ඉඳුනිල් නම් ව්‍යවසායකයා බිහිවීමට පසුබිම සැකසූ කරුණු දෙකක් සඳහන් කරන්න.

(2) ඉඳුනිල් නම් ව්‍යවසායකයාගෙන් පාරිභෝගිකයකු ලෙස අපට ලබාගත හැකි දෑ නම් කරන්න.

(3) ඉඳුනිල්ගේ ව්‍යාපාරය සාර්ථක කළ ව්‍යාපාර අදහස ලියන්න.

(4) ඉඳුනිල්ගේ කුමන ව්‍යවසායකත්ව ගතිලක්ෂණ මෙම සිද්ධියෙන් අනාවරණය වේද? ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(5) මෙම ව්‍යාපාරයෙන් ප්‍රතිලාභ අත්කර ගතහැකි වෙනත් ව්‍යාපාර දෙකක් ලියන්න.

(6) ඉඳුනිල්ගේ ව්‍යාපාරය හා සබැඳි පසුපස ව්‍යාපාර දෙකක් ලියන්න.

(7) මෙම ව්‍යාපාරය හා සබැඳි ඉදිරිපස ව්‍යාපාර දෙකක් ලියන්න.

(8) ඉඳුනිල්ට මෙම ව්‍යාපාරය සමග පවත්වාගෙන යා හැකි වෙනත් ව්‍යාපාර දෙකක් ලියන්න.

(9) ඉඳුනිල්ගේ ව්‍යාපාරය පුළුල් කිරීමට අවශ්‍ය බැවින් අවශ්‍ය යටිතල පහසුකම් ලබාගැනීමට අවශ්‍ය බව පවසයි. මෙම යටිතල පහසුකම් යන්න විස්තර කරන්න.

(10) ව්‍යාපාරයට අවශ්‍ය වාහනයක් මුල්‍ය කල්බදු ක්‍රමයට ලබාගැනීමට අදහස් කරන බව ඉඳුනිල් පවසයි. මුල්‍ය කල්බද්ද යන්න විස්තර කරන්න. (2 x 10 = 20)

02 (1) සමාජ ආර්ථික සංවර්ධනයට ව්‍යවසායකත්වයේ දායකත්වය සපයන ආකාර හතරක් ලියන්න.

(2) ව්‍යවසායකත්ව සංවර්ධනයට ඇති අභියෝග හතරක් ලියන්න.

(3) එම අභියෝග ජයගැනීමට වර්ධනය කළ යුතු ගුණාංග 4 ක් ලියන්න.

(4) වර්තමානයේ දී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පවා සමාජ ව්‍යවසායකත්වයේ යෙදෙනු දක්නට ලැබේ. සමාජ ව්‍යවසායකයකු වශයෙන් පාසල් දරුවකුට කළහැකි කාර්යයන් දෙකක් ලියන්න.

(5) සමාජ ව්‍යවසායකත්වය මගින් සමාජයට හා ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ දෙකක් ලියන්න. (2 x 5 = 10)

03 (1) කාන්තාවන් ව්‍යවසායකත්වයට යොමුවීම තුළින් දායකත්වය සපයන ආකාර කීයද? ඒ මොනවා ද?

(2) කුඩා ව්‍යාපාර හඳුනාගැනීමට ඇති ප්‍රමාණාත්මක නිර්ණායක 2 ක් ලියන්න.

(3) කුඩා ව්‍යාපාර සම්බන්ධයෙන් පැවතිය හැකි දුර්වලතා 2 ක් ලියන්න.

(4) ව්‍යවසායකයින් බිහිවීමට පසුබිම සපයන සාධක 4 ක් ලියන්න.

(5) සාර්ථක ව්‍යවසායකයකු වීමට බලපෑ ව්‍යාපාරයන්හි ව්‍යවසායකත්වයේ පිරිවැය දෙකක් සඳහන් කරන්න. (2 x 5 = 10)

04 (1) කිසියම් නිෂ්පාදනයක් නිපදවීමේ දී නිෂ්පාදන පිරිවැය වැඩිවිය හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.

(2) ව්‍යාපාරික ස්ථානයක් යෝග්‍ය පරිදි ස්ථානගත කිරීමට සැලකිල්ල දක්වන කරුණු 4 ක් ලියන්න.

(3) වැටුප් ලබන රැකියාවක් සම්බන්ධ අභියෝග දෙකක් ලියන්න.

(4) ව්‍යවසායකයා කටයුතු කළ යුතු විවිධ භූමිකා යටතේ අයිතිකරු භූමිකාවේ කළ යුතු කාර්යයන් ලියන්න.

(5) ව්‍යාපාරික ලෝකය අභියෝගවලින් මෙන්ම ගැටළු වලින් ද ගහන වේ. ව්‍යාපාරය තුළින්ම හටගන්නා ගැටළු දෙකක් ලියන්න. (2 x 5 = 10))

05 (1) කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමයක තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

(2) ව්‍යාපාර සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන විසින් සපයන මූල්‍ය නොවන පහසුකම් යටතේ සපයන අලෙවි පහසුකම් මොනවාද? විස්තර කරන්න.

(3) ව්‍යාපාර කටයුතුවලට බලපෑම් ඇතිකෙරෙන අභ්‍යන්තර පරිසර සාධකවලට අයත් වන්නේ මොනවාදැයි නම් කරන්න.

(4) ව්‍යාපාරයක බාහිර පරිසර සාධකයක් වන ප්‍රජා පරිසරයට අයත් සාධක හතරක් ලියන්න.

(5) ව්‍යාපාර අදහස් යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි විස්තර කරන්න. (2 x 5 = 10)

06 (1) වෙළඳපොළ තුළ පාරිභෝගික හැසිරීම කෙරෙහි බලපාන සාධක අතර පෞද්ගලික සාධක යටතට අයත් වන්නේ කුමන සාධකදැයි නම් කරන්න.

(2) වෙළඳපොළ සමීක්ෂණය ලෙස අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(3) වෙළඳපොළ හිදැස සම්පූර්ණ කිරීම තුළින් ව්‍යවසායකයාට උදාකර ගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(4) භාණ්ඩ හා සේවා බෙදාහැරීමේ ක්‍රියාවලියේ දී හමුවන කොමිස් නියෝජිතයා, තැරැව්කරු යන දෙදෙනා පැහැදිලි කරමින් හඳුන්වාදෙන්න.

(5) ඍජු අලෙවිකරණ ශිල්පීය ක්‍රම දෙකක් සඳහන් කරන්න. (2 x 5 =

| ශීර්ෂය | කේවල ස්වාමි ව්‍යාපාර | සීමා සහිත සමාගම් | සමුපකාර |
|---|---|---|---|
| 1. අයිතිය | | | |
| 2. ප්‍රාග්ධනය සපයාගැනීම | | | |
| 3. කළමනාකරණය | | | |
| 4. පැවැත්ම | | | |
| | (ල. 02) | (ල. 02) | (ල. 02) |

The National e-learning Portal for The General Education